සියළුම හිමිකම් ඇවිරිණි]
All Rights Reserved ]

# පාසල් වලට සිසුන් තොරා ගැනීමට සහ ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම සඳහා පැවැත්වෙන විභාගය

I පත්‍රය

## නැණ ලොවට පා නගන හපනුන්ට මඟ කියන

## “අදිති”

පැය 01

පෙරහුරු ප්‍රශ්න පත්‍රය - 03

විභාග අංකය ..............................

### විභාගයට පෙනී සිටින ඔබ සඳහා උපදෙස්

- ඔබේ විභාග අංකය ඉහත කොටුව තුළ ඇති තිත් ඉර මත ලියන්න.
- තුන්වැනි පිටුවේ ඇති නියමිත ස්ථානයේද ඔබේ විභාග අංකය ලියන්න.
- මෙම ප්‍රශ්න පත්‍රයේ ප්‍රශ්න 60 ක් ඇත ප්‍රශ්න සියල්ලටම පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේම ලියන්න.
- පිළිතුරු 3 ක් දී ඇති ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න පිළිතුරු ලියන්නට ඇති ප්‍රශ්නවල පිළිතුරු තිත් ඉර මත ලියන්න.
- කටුවැඩ කිරීම සඳහා කඩදාසියක් සපයනු ලැබේ

| පිටු අංකය | ලැබූ ලකුණු |
|---|---|
| 1 | |
| 2 | |
| 3 | |
| 4 | |
| 5 | |
| 6 | |
| 7 | |
| 8 | |
| එකතුව | |
| අවසාන ලකුණ | |
| ඉලක්කමෙන් | |
| අකුරෙන් | |

| | කෙටි අත්සන හා සංකේත අංකය |
|---|---|
| **පළමු පරීක්ෂක**<br>ලකුණු දීමේ පරිපාටිය අනුව උත්තර පත්‍රය ඇගයීම් කළ බව සහතික කරමි. | V/I/S |
| **දෙවන පරීක්ෂක**<br>පළමු පරීක්ෂක කර ඇති ඇගයීම් නිවැරදි බව සහතික කරමි. | V/I/S |
| **ඇගයීම් ලකුණු තහවුරු කිරීමේ පරීක්ෂක**<br>ඇගයීම් කර ප්‍රදානය කළ ලකුණු සහ අවසාන ලකුණ නිවැරදි බව තහවුරු කරමි. | V/I/S/EMF |
| **ප්‍රධාන පරීක්ෂක**<br>අධීක්ෂණය කළෙමි.<br>අවසාන ලකුණ නිවැරදිය. | V/I/S/CH |

✸ අංක 01 සහ 02 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට පහත සඳහන් රූපය ප්‍රයෝජනයට ගන්න.



01. රූපයේ දැක්වෙන උත්සවය වන්නේ,

(1) වෙසක් උත්සවයයි. (2) අවුරුදු උත්සවයයි (3) පොසොන් උත්සවයයි.

02. මෙහි දැක්වෙන වාද්‍ය භාණ්ඩය වන්නේ,

(1) රබාන (2) බෙරය (3) තම්මැට්ටම

✸ පහත දැක්වෙන රූප ඇසුරින් 03 සහ 04 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.



A B C D

03. ඉහත රූප කාණ්ඩ දෙකකට වෙන් කළ හැකිය. එම කාණ්ඩ දෙක වන්නේ,

(1) A හා B (2) C හා D (3) B හා D

04. සමමිතික රේඛා වැඩිම ප්‍රමාණයක් ඇති රූපය වන්නේ

(1) A (2) B (3) C

05. නිවැරදිව ඇඳ ඇති රූපය වන්නේ (මුහුණ බලන කණ්ණාඩියකින් බලන අවස්ථා 03ක් මෙහි දැක්වේ.)



(1) (2) (3)

06. ඇතුළත නොපෙනෙන පෙට්ටියක ඝනක 4ක් ද ගෝල 2ක් ද ඝනකාභ 3ක් ඇත. පෙට්ටිය දෙස නොබලා ඔබට එයින් ඝනකයක් ලබා ගැනීම සඳහා පෙට්ටියට අත දැමිය යුතු අවම වාර ගණන වන්නේ,

(1) 1 කි (2) 2 කි (3) 6 කි

07. පහත රූපයේ අඳුරු කර ඇති ප්‍රමාණය මුළු රූපයෙන්,



(1) භාගයකි (2) භාගයට වඩා වැඩි ය (3) භාගයට වඩා අඩු ය

08.




A හා B රූපවලින් දැක්වෙන්නේ ඉරටු කැබලි යොදාගනිමින් සකස් කළ ආකෘති දෙකකි. මෙම ආකෘති දෙක එකට එක් කොට සමචතුරස්‍ර 9ක් සහිත රූපයක් නිර්මාණය කිරීම සඳහා මෙම රූප දෙකෙන් ඉවත් කළ යුතු අවම ඉරටු කැබලි ගණන වන්නේ,

(1) 5 කි (2) 4 කි (3) 3 කි

09. සමන් ඡායා රූපයක් පෙන්වා මෙසේ පැවසුවේ ය. මෙම පින්තූරයේ සිටින්නේ මගේ මවට සහා පියාට සිටින දරුවන් අතරින් එකම ගැහැණු දරුවාය. එසේ නම් මෙම පින්තූරයේ සිටින්නේ,

(1) සමන් ය (2) සමන්ගේ අක්කාය. (3) සමන්ගේ අයියා ය

10. ළමුන් පිරිසක් පේළියකට සිටගෙන සිටියි. මෙහි මුල සිට ගණන් කළ විට කවිඳු සිටින්නේ පේළියේ 10 වෙනියාටය. පේළියේ සිටින සියලු අය ආපසු හැරුණහොත් (අන්තිමයා මුලට සිටින සේ) එවිට කවිඳු සිටින්නේ 9 වෙනියාටය. එසේ නම් පෝලිමේ සිටින සම්පූර්ණ ළමයින් ගණන වන්නේ.

(1) 19 කි (2) 20 කි (3) 18 කි

11. පහත රූපයේ කඩඉරි මගින් දැක්වෙන්නේ සැමන් ටින් එකක් කපා ඇති ආකාරයයි.



මෙසේ කැපූ විට මෙහි කැපුම් මුහුණතක හැඩය වන්නේ,

(1)



(2)



(3)



12. A රූපයේ සබඳතාව සැළකිල්ලට ගෙන B රූපයේ ප්‍රශ්නාර්ථ ලකුණ සහිත තැටියට දැමිය යුතු රූපය වන්නේ,



A B

(1) ○○○○ (2) ○○○ (3) ○○○○○

✸ 13 සහ 14 ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීම සඳහා පහත සඳහන් කවිය ප්‍රයෝජනයට ගන්න.

දබරැඟිල්ල ඉස්සර වී මඟ පෙන්වනවා
මැද ඇඟිල්ල උසට උසේ මැදින් ඉන්නවා
ළඟම ඉඳන් වෙද ඇඟිල්ල මුදු පළඳිනවා
පුංචි වුණත් සුළැඟිල්ලත් පස්සෙන් එනවා

13. කවියෙන් කියවෙන්නේ,
(1) අත ගැන (2) අතේ ඇඟිලි ගැන (3) ශරීරය ගැන

14. මෙහි මූර්ධජ අකුරු යෙදුන වචන ගණන වන්නේ,
(1) 4 කි (2) 2 කි (3) 5 කි

15. කාඩ්බෝඩ්වලින් කපා ගත් කුඩා ත්‍රිකෝණ කීපයක් මගින් නිර්මාණය කළ රූපයක් පහත දැක්වේ.



මෙම රූපය සකස් කිරීමට යොදාගත් කුඩා ත්‍රිකෝණ ගණන වන්නේ,

(1) 9 කි (2) 13 කි (3) 6 කි

✸ කිසියම් සිදුවීමක අවස්ථා කීපයක් 16 සහ 17 ප්‍රශ්න සඳහා ලබා දී ඇත. ඒවා නිවැරදි අනුපිළිවෙළට ගැළපූ විට දක්නට ලැබෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

16.



A B C D E

(1) ACDBE (2) ACDEB (3) ADCBE

17. 

A B C D E

(1) CEDBA (2) CEBDA (3) CBDAE

18. ගමන් කරන රථයක නිතරම ඇත්තේ,

(1) රියදුරු ය (2) මගීන් ය (3) කොන්දොස්තරය

19. වැවක නිතරම ඇත්තේ,

(1) ජලයයි (2) දිය නෑමට ආ මිනිසුන් (3) වැව් බැම්ම

✸ ළමුන් 4 දෙනෙකුගේ උපන් දිනයක් පහත දැක්වේ.

| | |
|---|---|
| ළහිරු - 2014.01.20 | රසික - 2013.04.20 |
| කවිදු - 2014.11.30 | චමිලා - 2012.01.01 |

20. මෙහි වයසින් බාලයා වන්නේ,

(1) චමිලා (2) කවිදු (3) ළහිරු

21. වයස අනුව සිසුන් 4 දෙනා ආරෝහණ ක්‍රමයට පෙළගැස් වූ විට,

(1) චමිලා, රසික, ළහිරු, කවිදු
(2) කවිදු, ළහිරු, රසික, චමිලා
(3) ළහිරු, කවිදු, රසික, චමිලා

22. එකම ප්‍රමාණයේ ඉටිපන්දම් කිහිපයක් දල් වී ඇති ආකාරය පහත දැක්වේ.




ඉටිපන්දම් දල් වී ඇති කාලය අනුව ආරෝහණ ක්‍රමයට පෙළ ගැස් වූ විට,

(1) D, B, A, C (2) C, A, B, D (3) B, A, C, D

23. පහත දැක්වෙන රූපයේ දක්නට ලැබෙන සමචතුරස්‍ර ගණන වන්නේ,



(1) 9 කි (2) 8 කි (3) 10 කි

✸ පහත සබඳතාව තේරුම්ගෙන 24 සහ 25 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.

24. කිරි ⟶ යෝගට් නම් ________________ ⟶ බත් හිස්තැනට ගැළපෙන පිළිතුර වන්නේ,

(1) වී (2) සහල් (3) එළවළු බත්

25. ඉන්ධන ⟶ මෝටර්රථය නම් ________________ ⟶ සරුංගලය

(1) පොල්කුරු (2) කඩදාසි (3) සුළඟ

26. ගිනිකූරු කිහිපයක් යොදාගෙන සකස් කළ මාළුවෙකුගේ රූපයක් පහත දක්වේ.



මෙම මාළුවා පිහිනා යන දිශාව වෙනස් කිරීම සඳහා (කුමන හෝ දිශාවකට) මාළුවා සකස් කිරීමට ගත් ගිනිකූරු කීයක් අවයම වශයෙන් වෙනස් කළ යුතු ද?

(1) 1 කි (2) 4 කි (3) 2 කි

27. සනත් උදෑසන පාසල් යන විට ඔහුගේ සෙවණැල්ල ඔහු ඉදිරියෙන් ගමන් කලේ නම් සනත් ගමන් කළ දිශාව වන්නේ,

(1) බස්නාහිර දිශාවට (2) නැගෙනහිර දිශාවට (3) උතුරු දිශාවට

28. 21cm ක් දිග වයර් කැබැල්ලක් 3cm දිග ඇති කුඩා කොටස්වලට කපා ගැනීමට අනිල්ට අවශ්‍ය වීය. එසේ නම් 21 cm දිග වයර් කැබැල්ල ස්ථාන කීයකින් කැපිය යුතු ද?

(1) 7 කි (2) 8 කි (3) 6 කි

29. එක් බීම බෝතලයකින් 10 දෙනෙකුට සංග්‍රහා කළ හැකිය. උත්සවයක් සඳහා 71 දෙනෙකු පැමිණියේ නම් ඔවුන්ට සංග්‍රහ කිරීමට බීම බෝතල් කීයක් අවශ්‍ය වේද?

(1) 7 කි (2) 6 කි (3) 8 කි

30. ගොඩක දොඩම් ගෙඩි 20ක් ඇත. කසුන් එම දොඩම් ගෙඩි ගොඩෙන් ගෙඩි 4 බැගින් ගෙන පෙට්ටියකට දමයි. එම සෑම වාරයක දීම කසුන්ගේ නංගී ගෙඩි 2 බැගින් ගෙන නැවත දොඩම් ගෙඩි ගොඩට දමයි. කසුන්ට ගොඩේ තිබෙන සියලුම දොඩම් ගෙඩි පෙට්ටියට දැමීමට වාර කීයක් උත්සාහ කළ යුතු ද?

(1) 10 කි (2) 11 කි (3) 9 කි

31. එකම ස්ථානයකින් ගමන් ආරම්භ කළ මෝටර් රථ දෙකක් එකිනෙකට ප්‍රතියවිරුද්ධ දිශාවන්ට 100m බැගින් ගමන් කර එක් මෝටර් රථයක් රියදුරාගේ දකුණු අත පැත්තටත් අනෙක් රථය රියදුරාගේ වම් අත පැත්තටත් හරවා 70 m බැගින් කර නවතයි. එවිට මෝටර් රථ දෙක අතර ඇති අවම දුර වන්නේ ?

(1) 200 m කි (2) 240 m කි (3) 300 m කි

✸ පහත සංඛ්‍යා රටාවල හිස්තැන් සඳහා ගැළපෙන පිළිතුරු තෝරන්න.

32. 


(1) 14 කි (2) 16 කි (3) 10 කි

33.

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| 10 | 12 | 15 | 16 | 20 | 20 | 25 | 24 | — |

(1) 25 කි (2) 30 කි (3) 26 කි

34. පහත වෘත්තවල අඳුරු වී ඇති රටාව තේරුම් ගෙන හිස්තැනට ගැළපෙන පිළිතුර තෝරන්න.



(1) 

(2) 

(3) 

35. වෙළෙඳසැලක සැමන් ටින් ගොඩ ගසා ඇත්තේ ත්‍රිකෝණාකාර හැඩයකටය. එහි යටම පේළියේ ටින් 10ක් ඇත් නම් ගොඩේ තිබෙන මුළු සැමන් ටින් ගණන සොයන්න.

(1) 45 කි (2) 55 කි (3) 40 කි

36. දැතිරෝද කිහිපයක් සම්බන්ධ වී ඇති ආකාරය දැක්වෙන රූපයක් පහත දැක්වේ.




දැති රෝද කරකැවෙන ආකාරය සැලකිල්ලට ගත් විට පහත පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර වන්නේ,

(1) A හා B එකම පැත්තට කරකැවේ.
(2) A හා C එකම පැත්තට කරකැවේ.
(3) C හා D එකම පැත්තට කරකැවේ.

37. 


සම්පූර්ණයෙන් ම ජලය පිරුණු ජල ටැංකියක් මෙම රූපයේ දැක්වේ. මෙහි මෙම ටැංකියේ ජලය $\frac{3}{4}$ (තුන්කාලක්) ප්‍රමාණයක් රඳවාගැනීම සඳහා විවෘත කළ යුතු සිදුර වන්නේ,

(1) A (2) B (3) C

✸ පහත සඳහන් රූප සටහන් විස්තරය සැලකිල්ලට ගෙන 38 සහ 39 ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.




400m දුරක් සහිත ධාවක මන්තීරුවක් මෙම රූප සටහනේ දැක්වේ. මෙහි ධාවනයේ යෙදී සිටින A ක්‍රීඩකයාගේ වේගය B ක්‍රීඩකයාගේ වේගය මෙන් දෙගුණයකි. (දෙදෙනාම එකම ස්ථානයකින් තරඟය ආරම්භ කරයි.)

38. B ක්‍රීඩකයා මෙම මන්තීරුවේ 400m ක් ගමන් කරන විට A ක්‍රීඩකයා වට කොපමණ ප්‍රමාණයක් ගමන් කරයි ද?

(1) 800 m (2) 2 කි (3) 4 කි

39. A ක්‍රීඩකයා මෙම මන්තීරුවේ වට දෙකක් ගමන් කරන විට A ක්‍රීඩකයා සහ B ක්‍රීඩකයා අතර දුරේ වෙනස කොපමණ ද?

(1) 600m කි (2) 400m කි (3) 0 m කි

40. මාළු ටැංකියක සිටින මාළුවෙකු මුඛයෙන් වායු බුබුළු පිට කරන ආකාරයේ රූප සටහන් තුනක් පහත දැක්වේ.



A B C

මෙහි නිවැරදිව ඇඳ ඇති රූපය වන්නේ,

(1) A ය (2) B ය (3) C ය